ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/DSP/DPU/03/14 චක්‍රලේඛ අංකය : PS/DSP/DPU/C/11/2019

2019 මාර්තු මස 18 වන දින

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,**
**සියලුම දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්,**
**ත්‍රිවිධ හමුදාපතිවරුන්/පොලිස්පති,**
**සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ**
**සියලුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත**

**මතින් නිදහස් රටක් වෙනුවෙන් "බක් මහ දිවුරුම"**

අතිගරු ජනාධිපතිතුමාගේ තිරසර සංවර්ධන සංකල්පය යටතේ එතුමාගේ සෘජු අධීක්ෂණය සහ මෙහෙයවීම මත ක්‍රියාවට නැංවෙන **"මතින් නිදහස් රටක්"** මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන මේ වනවිට දිවයින පුරා විවිධ වැඩසටහන් ඔස්සේ ක්‍රියාත්මක වේ. මෙම ජාතික කර්තව්‍යය සාර්ථක කරගැනීම සඳහා රාජ්‍ය මෙන්ම සිවිල් අංශවල පුරෝගාමීත්වයෙන්, ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සියලු පාර්ශවයන් ඒකරාශීව කැපවීමෙන් කටයුතු කළ යුතුව තිබේ.

දරුණු ව්‍යසනයක් බඳුව පැතිර යන මෙම නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම පොලිසිය ඇතුළු අනෙකුත් ආරක්ෂක අංශ හරහා අත්අඩංගුවට ගැනීම්, වැටලීම් හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මත පමණක් පාලනය කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින් පවුල් සංස්ථාවේ සිට සමාජ සංස්ථාව දක්වා පුළුල් ආකල්පමය වෙනසක් තුළින් මෙය පිටුදැකීමට කාලය එළඹ ඇත.

ඒ අනුව, ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම නියෝජනය කරනු ලබන සියලුම රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් හා සියලු කාර්ය මණ්ඩලයේ සක්‍රීය දායකත්වයෙන් **2019.04.03** වන දින පෙරවරුවේ මේ සම්බන්ධයෙන් කෙටි වැඩසටහනක් පහත දැක්වෙන ආකාරයට පැවැත්වීමට ක්‍රියා කළයුතු අතර, එහි සමාරම්භක උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් **එදින කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.**

i. **සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා විසින් ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.**

ii. **අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සමාරම්භක උත්සවයේ සජීවී විකාශයට සමගාමීව පෙ.ව. 8.30 ට සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් තම තමන්ට පහසු භාෂාවකින් (මේ සමඟ එවා ඇති) මතින් නිදහස් රටක් වෙනුවෙන් "බක්මහ දිවුරුම" හඬ නගා කියවීම.**

iii. **අතිගරු ජනාධිපතිතුමා විසින් ජාතිය අමතා සිදු කරනු ලබන කතාවට සවන් දීම.**

iv. **මතින් නිදහස් රටක් උදා කිරීම උදෙසා ක්‍රියාවට නැංවෙන මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ සැම දෙනාගේම දායකත්වය අවංකව, අප්‍රමාදව සහ දැඩි කැපවීමෙන් යුතුව ලබාදීමේ අවශ්‍යතාවය තේමා කරගත් කෙටි දේශනයක් ආයතන ප්‍රධානියා විසින් පැවැත්වීම.**

v. **මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් හඳුන්වා දී ඇති තේමා ගීතය (මේ සමඟ එවා ඇති) වාදනය කිරීම.**

ජාතික වැඩසටහනක් ලෙස එදින දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

මෙම ජාතික ව්‍යසනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාව මුදා ගැනීම උදෙසා රාජ්‍ය සේවකයින් ලෙස ඇප කැපවී ක්‍රියා කරමු.

**උදය ආර්. සෙනෙවිරත්න**
**ජනාධිපති ලේකම්**

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk